# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2403/52 – 2024 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා – 2024.09.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2022/69.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2391/36 දරන හා 2024.07.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් මාලඹේ, වැව පාර, අංක 289/8 හි පදිංචි ආර්. පී. අයි. එච්. රාජපක්ෂ මිය සහ අතුරුගිරිය, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත හි පිහිටි ජාතික වැවිලි කළමනාකරණ ආයතනය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 86/2023 දරන හා 2024.05.10 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ආර්. පී. අයි. එච්. රාජපක්ෂ මිය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 86/2023 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2025.07.05 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය: ආර්. පී. අයි. එච්. රාජපක්ෂ,
289/8, වැව පාර, මාලඹේ.
දිනය: 2024.09.03

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2024.07.06 දිනැති අංක 2391/36 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, ආර්. පී. අයි. එච්. රාජපක්ෂ සහ අතුරුගිරිය, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත හි පිහිටි ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය බැඳී සිටින්නා වූ ද, A 86/2023 හා 2024.05.10 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. පී. අයි. එච්. රාජපක්ෂ
*(පළමු පාර්ශ්වය)*

*පිටපත* : *(අනෙක් පාර්ශ්වය)*

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය,
එම්. ඩී. එච්. ජයවර්ධන මාවත,
අතුරුගිරිය.

1. ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුට වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) සහ 20(1) වන වගන්ති බලන්න)

2. දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද, යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 09 – 0187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.